# අධ්‍යයන සාරාංශය

ලොව සෑම පුද්ගලයකු තුළම ශ්‍රේෂ්ඨතමයකු වීමේ බීජය ගැබ්ව ඇත. එමෙන්ම විවිධ විභව්‍යතාවයන්ද ඔවුන් තුළ ඇත. එම විභව්‍යතාවයන් හඳුනා ගෙන මතු කර ඔප්නංවා විකසිත කරලීමේලා ප්‍රබල කාර්යභාරයක් පාසල නැමති ආයතනය වෙත පැවරී ඇත. එසේම අනාගත ලෝකය අපේක්ෂා කරන දැනුම, ආකල්ප, හා නිපුණතා වලින් පිරිපුන් පෞරුෂයකින් යුත් පුද්ගලයින් තැනීම ද පැවරී ඇත්තේ මෙම පාසල් පද්ධතියටයි. පාසලේ ප්‍රධාන නියමුවන් වන ගුරුවරුන් හට මෙම වගකීම පැවරී ඇත. විවිධ ගැටලු හා [illegible] හේතු සාධක තිබුණත්, ගුරුවරුන් වන අප සැමගේ උත්සාහය විය යුත්තේ එම අභියෝගාත්මක වගකීම භාරගෙන එය මනාව ඉටු කිරීමයි. ඒ අනුව පන්ති කාමර ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සිසුනට ඵලදායී ඉගෙනුම් අවස්ථා ඇති කරවන්නක්සේම ගුරුවරුන්ට සිය වෘත්තිය සංවර්ධන මට්ටම් දියුනු කර ගන්නා මාර්ගද තහවුරු කළ යුතු වේ. කිසියම් කාර්යයක් නියමිත හා අපේක්ෂිත ආකාරයට සිදුවේදැයි සොයා බැලීම අධීක්ෂණය වශයෙන් කෙටියෙන් හැඳින්විය හැක. ඒ අනුව ගුරුවරයාගේ ඉගැන්වීම් ක්‍රියාවලිය වඩාත් ප්‍රශස්ත ආකාරයකින් වර්ධනය කිරීම මෙන්ම ශිෂ්‍ය ශක්තීන් හඳුනාගෙන ඔවුන් ගෙන යා හැකි උපරිම තලය වෙත රැගෙන යාම සඳහා මග පෙන්වීම පන්ති කාමර අභ්‍යන්තර අධීක්ෂණයේ මුඛ්‍ය පරමාර්ථයන් වේ. ඒ අනුව සිසුනට ඵලදායී ඉගෙනුම් අවස්ථා මෙන්ම ගුරුවරුන්ට ඉගැන්වීම් අවස්ථා ඇති කරලීම සහ සංවර්ධනය කිරීම සඳහා අත්‍යවශ්‍ය දෙයක් ලෙස පන්ති කාමර අධීක්ෂණය හැඳින්විය හැකිය. මෙම පන්ති කාමර අධීක්ෂණය පාසලේ ඉගෙනුම්-ඉගැන්වීම් අවස්ථා සංවර්ධනය කරන, ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රියාවලියේ ඵලදායීතාවය ඉහළ නංවන සංවර්ධනාත්මක ප්‍රවේශයකි.

පෙරදී පන්ති කාමර අධීක්ෂණය පිළිබඳව එතරම් උනන්දුවක් නොදක්වන ලදි. එකල අධීක්ෂණය පරීක්ෂණයක ස්වරූපයක් ගත් අතර එය තීරණ ගැනීමේ කාර්යයක් විය. එහෙත් මෑතකදී කළමනාකරණ ක්‍රියාවලිය පිළිබඳ ඇති වූ උනන්දුව නිසාත් කළමනාකරණ ක්‍රියාවලිය අධ්‍යාපන පද්ධතියට යොමු වීම නිසාත් අධීක්ෂණයේ අවශ්‍යතාවය අවබෝධ වී තිබේ. කළමනාකරණ ක්‍රියාවලියේ මෙහෙයවීමේ අංගය යටතේ කළමනාකරුවකු විසින් විශේෂයෙන්ම කළයුතු කාර්යයක් වශයෙන් අධීක්ෂණය සැලකිය හැක. ඒ අනුව පාසල් පද්ධතිය තුළ විධිමත් හා සංවිධානාත්මකව මෙම අධීක්ෂණ ක්‍රියාවලිය ඉටුවීම අනිවාර්ය අවශ්‍යතාවයකි. එවිට මෙම අධීක්ෂණ ක්‍රියාවලිය මගින් ගුරුවෘත්තියේ ගුණාත්මක සංවර්ධනයක් තහවුරු කෙරෙන බව සැලකිය හැක.

ඒ අනුව පාසල තුළ ඉගෙනුම්-ඉගැන්වීම් කාර්යය හා සම්බන්ධව අභ්‍යන්තර පන්ති කාමර අධීක්ෂණයේ පසුබිම සොයා බැලීම, අභ්‍යන්තර පන්ති කාමර අධීක්ෂණ ක්‍රියාවලිය පාසල තුළ ක්‍රියාත්මක වන ආකාරය සොයා බැලීම, පවතින අධීක්ෂණ ක්‍රමයේ ප්‍රබලතා හා දුබලතා විමර්ශනය කිරීම, විදුහල්පති, අධීක්ෂක හා ගුරු අදහස් අනුව ගුරුවෘත්තිය සංවර්ධනය සඳහා යෝජනා ඉදිරිපත් කිරීම යන ප්‍රධාන අරමුණු හතර ඔස්සේ මෙම පර්යේෂණ අධ්‍යයනය සිදු කෙරිණි. ඒ අනුව හම්බන්තොට දිස්ත්‍රික්කයේ තංගල්ල අධ්‍යාපන කලාපයට අයත් 1A B,1C, 2, හා 3 වර්ගයේ පාසල් 41 ක් පමණ වූ අධ්‍යාපන සංගහනය තුළින් 1AB වර්ගයේ පාසල් 01 ක් ද,C වර්ගයේ පාසල් 01 ක් ද, 2 වර්ගයේ පාසල් 01 ක් ද, වන සේ පාසල් 03 ක් අධ්‍යයන නියදියට ඇතුලත් විය. එමෙන්ම එම නියදි ඒකකයේ වූ ගුරුවරුන් 50 දෙනෙකු ද, අභ්‍යන්තර අධීක්ෂණ කටයුතු වල නිරත වන අංශ ප්‍රධානීන්, ශ්‍රේණි ප්‍රධානීන් හා විෂය ප්‍රධානීන් 40 දෙනෙකු ද, විදුහල්පති, නියෝජ්‍ය විදුහල්පතිවරුන් 10 දෙනෙකු ද, වශයෙන් මුළු අධ්‍යයන නියදිය 100 ක් ලෙස තෝරා ගැණින.

අධ්‍යයන ක්ෂේත්‍රයට අදාල පර්යේෂණ සාහිත්‍ය විමර්ශනය කිරීම දෙවන පරිච්ඡේදය තුළ දී සිදුවිය. ලෝකයේ අධ්‍යාපනඥයින් හා පර්යේෂකයන් පන්ති කාමර අධීක්ෂණය පිළිබඳ විවිධ නිර්වචන හා සංකල්ප ප්‍රකාශ කර ඇත. අධ්‍යාපන අධීක්ෂණ සංකල්පය පිළිබඳ ගුඩ් (1973) ඉදිරිපත් කළ නිර්වචනය මෙසේ දක්විය හැක.

"ගුරුවරුන්ගේ ඉගැන්වීම දියුණු කිරීමට උපදෙස් දීම,ගුරුවරුන්ගේ වෘත්තිය වර්ධනය ඇති කිරීමට පෙළඹවීම, අධ්‍යාපන අරමුණු තෝරා ගැනීමට හා පුනරීක්ෂණය කිරීමට උපදෙස්දීම, අධීක්ෂණය ලෙස දක්වයි" (ගුඩ් Good,1973 : 14)

මෙම අධ්‍යයනය සඳහා විස්තරාත්මක පර්යේෂණ ක්‍රමවේදය භාවිතා කළ අතර, ප්‍රශ්නාවලි හා සම්මුඛ සාකච්ඡා යොදා ගනිමින් අධ්‍යයනයට අදාල දත්ත රැස් කර ගන්නා ලදී.ඒ අනුව නියදිය තුළ වූ අධීක්ෂකවරුන් වශයෙන් කටයුතු කරන අංශ ප්‍රධානීන්, ශ්‍රේණි ප්‍රධානීන්, විෂය ප්‍රධානීන්, සඳහා එක් ප්‍රශ්නාවලියක්ද, ගුරුවරුන් සඳහා එක් ප්‍රශ්නාවලියක්ද,ලබා දෙන ලදී. විදුහල්පත්වරුන් හා නියෝජ්‍ය විදුහල්පත්වරුන් සම්මුඛ සාකච්ඡා සඳහා සම්බන්ධ කරගෙන තොරතුරු ලබාගන්නා ලදී. එම දත්ත වගු, ප්‍රස්තාර, ප්‍රතිශත, ආදී සංඛ්‍යාන විද්‍යාත්මකව විශ්ලේෂණයට භාජනය කළ අතර, ඒ අනුව ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රියාවලිය තුලින් ගුරුකාර්යය සංවර්ධනයට අභ්‍යන්තර පන්ති කාමර අධීක්ෂණය යොදා ගැනීම සම්බන්ධව පර්යේෂකයාගේ යෝජනාද ඉදිරිපත් කෙරිණි.

සැලසුම් සහගත හා යාවත්කාලීන නොවූ අභ්‍යන්තර අධීක්ෂණ පිළිවෙලක් පාසල් පද්ධතියේ දක්නට ලැබීම, අධීක්ෂණයේ යෙදෙන ඇතැම් අධීක්ෂකවරුන් නුසුදුස්සන් යන අවිශ්වාසය ගුරුවරුන් තුළ පැවතීම ,අධීක්ෂණය වැරදි සොයන ක්‍රියාදාමයක් ලෙස දැක්වීම,

පන්තිකාමර අධීක්ෂණය පිළිබඳ විදුහල්පතිවරුන්ගේ විමර්ශනය අඩුවීම, අධීක්ෂණ භූමිකා පිළිබඳ අධීක්ෂකවරුන්ගේ නොදැනුවත්කම, පවතින අධීක්ෂණ ක්‍රමයේ වෙනසක් කළ යුතු බව යනාදී නිගමන වලට පර්යේෂකයා එළඹුන අතර අභ්‍යන්තර අධීක්ෂණ කටයුතු වඩාත් සැලසුම් සහගත ලෙස යාවත්කාලීනව පවත්වාගෙන යා යුතු වීම, එය විදුහල්පති ඇතුළු ඉහළ අධ්‍යාපන නිළධාරීන්ගේ විමර්ශනයට ලක් විය යුතු වීම, වඩාත් විශ්වසනීය ක්‍රියාවලියක් ලෙස අභ්‍යන්තර පන්ති කාමර අධීක්ෂණය පවත්වාගෙන යාම, අධීක්ෂකවරුන්ට අධීක්ෂණය සම්බන්ධ මනා පුහුණුවක් ලබා දීම, ගුරු හා අධීක්ෂක අතර සමීප සම්බන්ධතා ගොඩ නැගීම, ආදර්ශ ඉගැන්වීම් සිදුකිරීම ආදී යෝජනා ඉදිරිපත් කිරීම අධ්‍යයනය අවසානයේ දී පර්යේෂකයා විසින් සිදුකරන ලදී .